# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2211/51 - 2021 ජනවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.ඕ. 4/81 (XIII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23 ද (1) (අ) වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද (1) (අ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පරිසර අමාත්‍ය, මහින්ද අමරවීර වන මා විසින්, මේ නියමය මගින්, 2021 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි -

(අ) යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා පාවිච්චි කරනු ලබන කෘෂි රසායන ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා පොලිඑතිලීන් ටෙරප්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය; සහ

(ආ) යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා මෙහි නිශ්චිතව දක්වා ඇති යම් ප්ලාස්ටික් අයිතම :-

(i) ශුද්ධ පරිමාව මි.ලී. 20 ට/ශුද්ධ බර ග්‍රෑම් 20 ට සමාන හෝ ඊට අඩු සැෂේ (Sachet) (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිත කිරීම සඳහා හැර) ;

(ii) හුළංවලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල, දිය මත පාවෙන/පිහිනුම් තටාකවල දී භාවිත කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර) ;

(iii) ප්ලාස්ටික් කුර (Stem) සහිත කොට්න් බඩ්ස් (Cotton buds) (වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් කොට්න් බඩ්ස් හැර),

පාවිච්චි කිරීම තහනම් කරනු ලබමි.

මේ නියමයේ කාර්ය සඳහා -

"කෘෂි රසායන ද්‍රව්‍ය" යන්නෙන්, පලිබෝධනාශක, වර්ධනය පාලනය කරන ද්‍රව්‍ය, දියරමය පොහොර ඇතුළු කෘෂිකර්මාන්තයේ දී භාවිත කරනු ලබන සියලුම රසායන ද්‍රව්‍ය අදහස් වේ;

"ප්ලාස්ටික් අයිතමයක්" යන්නෙන්, පොලිඑතිලීන් ටෙරෙප්තලේට්, වැඩි ඝනත්වයකින් යුත් පොලිඑතිලීන්, අඩු ඝනත්වයකින් යුත් පොලිඑතිලීන් පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, පොලිප්‍රොපිලින්, පොලිස්ටයිරීන්, ජෛවභායනීය ප්ලාස්ටික් හෝ වෙනත් යම් සමාන අමුද්‍රව්‍ය හෝ ඒවායේ යම් මිශ්‍රණයකින් සාදන ලද නිෂ්පාදනයක් අදහස් වේ;

"ක්‍රියාවලිය" යන්නට, නිෂ්පාදනය ඇතුළත් වේ; සහ

"වෙළෙඳාම" යන්නට, විකිණීම සහ විකිණීම සඳහා අර්පණය ඇතුළත් වේ.

**මහින්ද අමරවීර,**
පරිසර අමාත්‍ය.

2021 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

02 - 16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.